සේවයට කැපවෙමු - පුරවැසි අයිතීන් සුරකිමු
அர்ப்பணிப்புடன் சேவையாற்றுவோம் - பிரஜைகளின் உரிமைகளைக் காப்போம்
**LETS DEDICATE TO SERVICE FOR PROTECTING THE RIGHTS OF CITIZEN**

# පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය
# பிரஜைகள் சேவை பெறுனர் பட்டயம்
# CITIZENS CLIENT CHARTER



## ජාතික යොවුන් සේනාංකය
## தேசிய இளைஞர் படையணி
## National Youth Corps

විනය
ஒழுக்கம்
**DESCIPLINE**

නායකත්වය
தலைமைத்துவம்
**LEADERSHIP**


පෞරුෂය
ஆளுமை
**PERSONALITY**

# ජාතික යොවුන් සේනාංකය


"ඔබ ප්‍රවේශව සිටින්නේ අභිමානවත් ජව සම්පන්න තාරුණ්‍යයක් දැයට දායාද කරලීම වෙනුවෙන් කැපවී සිටින එකම රාජ්‍ය ආයතන පරිශ්‍රයටයි."

## අපගේ දැක්ම

ගෝලීය සමාජයට ගැලපෙන, අභිමානවත්, සමබර ශ්‍රී ලාංකීය තාරුණ්‍යයක්.



## අපගේ මෙහෙවර



නව්‍ය සංස්කෘතියක් උදෙසා සමාජ සංවර්ධනයට දායක වෙමින් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමුඛතම සේවා සම්පාදන ආයතනය ලෙස ජීවන නිපුණතා ප්‍රශස්තව හා තිරසරව අත්කර දෙමින් ඉලක්ක ප්‍රජාව බලගන්වමින් ජාතික සංවර්ධනයට දායක වීම.

## යොවුන් සේනාංක ආචාරධර්ම

- විනය
- නායකත්වය
- පෞරුෂය
- වගකීම
- වගවීම
- විෂය විශේෂඥතාවය
- කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය
- ගුණාත්මකභාවය
- මෙහෙයවීම
- නිරන්තර පුහුණුව හා යාවත්කාලීන වීම

උසස් ආචාර ධර්ම ගරු කොට ගනිමින් සේවා සම්පාදනය කිරීමට ජාතික යොවුන් සේනාංක කාර්ය මණ්ඩලය කැපවී සිටින්නෙමු.

## අපගේ කාර්යභාරය

ජාතික යොවුන් සේනාංකයේ කාර්යයභාරය වනුයේ යොවුන් සංවර්ධනය සහ රැකියා පුහුණුව හා වෘත්තීය අධ්‍යාපනය වේ. යොවුන් සංවර්ධනය සඳහා වූ ප්‍රමුඛතම උපාය මාර්ගය ලෙස තරුණයන් තුළ ජීවන කුසලතා සංවර්ධනය යොවුන් සේනාංකය විසින් හඳුනාගෙන ඇත.

## ආයතනික අපේක්ෂා හා ප්‍රතිලාභ

- සය මාසික පාඨමාලාව මගින් විනය, නායකත්වය සහ පෞරුෂත්වය ඉලක්ක කරගනිමින් තාරුණ්‍ය තුළ ජීවන කුසලතා සංවර්ධනය කිරීම හා සමාජ සවිඥානික බව වර්ධනය කිරීම.
- පාඨමාලා අවසානයේ පුහුණුව ලද තරුණ පරපුර හට වෘත්තීය සහ දෛනික ජීවිතයේ අභියෝගවලට ආත්ම විශ්වාසයෙන් යුක්තව මුහුණ දීමට හැකියාව.
- ජීවන කුසලතා සංවර්ධනය කර ගන්නා ලද තරුණ පරපුරට දේශීය සහ අන්තර්ජාතික රැකියා වෙළෙඳපොළේ අධිෂ්ඨානශීලීව කටයුතු කිරීමේ හැකියාව.
- පුහුණු පාඨමාලා අනුසාරයෙන් සංගීතය, රංග කලාව, කථිකත්වය හා නිර්මාණශීලි හැකියාවන් යනාදී සැඟවුණු කුසලතා එළිදැක්වීමට ද අවස්ථාව උදා වීම.
- යොවුන් ශිෂ්‍ය භටයන් හට ශ්‍රී ලංකාවේ ප්‍රකට බුද්ධිමතුන් සමග අන්‍යෝන්‍ය වශයෙන් කටයුතු කිරීමටත්, ඔවුන්ගේ අත්දැකීම් තුළින් ඉගෙන ගැනීමටත් අවකාශය සැලසීම.
- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලද ආයතනවලින්, ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණ පාඨමාලා සඳහා උසස් සහතික නිකුත් කෙරෙන අතර, ඒ අනුව අදාළ විෂයන් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා ද උදාකරගත හැකි වීම.
- මව්බසට අමතරව වෙනත් භාෂා හැදෑරීමට අවස්ථා සලසා දීමෙන් පුහුණුලාභීන් තුළ වෙනත් භාෂා හැදෑරීමේ උනන්දුව ද වර්ධනය කරනු ලබයි (ජපන්, චීන).
- දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථානවලින් මධ්‍යස්ථාන මට්ටමින් තෝරාගනු ලබන විශිෂ්ඨ දක්ෂතා සහිත පුහුණුලාභීන් 30 බැගින්, රු.100,000 ක උපරිමයකට යටත්ව ශිෂ්‍යත්වයක් සමග බාහිර වෘත්තීය පුහුණු ආයතන වලට යොමු කිරීම. ( කොන්දේසි අදාල වේ.)
- පාඨමාලාවේ සය මාසික කාලය තුළ සංවිධානය කෙරෙන විවිධ ප්‍රජා සහ ස්වෙච්ඡා ව්‍යාපෘතිවලට සහභාගි වන “Youth Cadet ”වරුන් සමාජ අවබෝධය ලබා ගනිමින් දැනුමෙන් සහ අත්දැකීමෙන් වඩා විශිෂ්ඨත්වයට පත් වීම.
- ක්‍රීඩාවට හැකියාව සහ ලැදියාව ඇති යොවුන් පරපුරට ඔවුන්ගේ සිහින හඹා යමින් ජාතික මට්ටමට ළඟා වෙමින් අනාගත ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය සහයෝගය ලබාදීම සහ ඔවුන්ව ඒ සඳහා දිරිමත් කිරීම.
- නර්තනයට, ගායනයට සහ රංගනයට හැකියාව ඇති තරුණ තරුණියන් ඒකරාශී කරමින් ඔවුන්, ප්‍රවීන පළපුරුදු උපදේශක මණ්ඩලයක් යටතේ පුහුණු කරමින් ජාතික තලයට ගෙන ඒම සඳහා අවශ්‍ය ඉඩහසර සකස් කර දීම.
- කෘෂිකර්මය, ස්වයං රැකියා වැනි ව්‍යවසායකත්වය සඳහා වඩාත් උනන්දුවක් දක්වන තරුණ තරුණියන්ට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ අනුග්‍රහයෙන් ඔවුන්ට අවශ්‍ය උපදෙස්, මූල්‍ය ප්‍රතිපාදන සහ ණය පහසුකම් ලබා ගැනීමට මාර්ගෝපදේශකත්වය ලබා දීම.
- ස්වභාවික ව්‍යසන හා හදිසි උපද්‍රවයන්හිදී නොපසුබටව ඉදිරිපත් වීම සඳහා ආත්ම විශ්වාසය හා අධිෂ්ඨානය ඇති කරලීම.
- සමාජය තුළ පිහිටක් අවැසි අසරණ වූවන්හට පිහිටවීමට අවශ්‍ය ආකල්ප සංවර්ධනය ඇති කිරීම.
- පරිවර්තනීය තරුණ පරම්පරාව සඳහා ගැලපෙන පාඨමාලා හඳුන්වාදීම.
- ජාත්‍යන්තරව පිළිගත් පුහුණු ආයතන සමග අනුබද්ධව සහයෝගීතාවයන් ගොඩනැගීම.

## "YOUTH CADET" වරුන් හට ලැබෙන ප්‍රතිලාභ

1 ජීවන කුසලතා පුහුණු පාඨමාලාව නොමිලේ හැදෑරීමට ඇති අවස්ථාව.

2 පාඨමාලාව සම්පූර්ණ කිරීමේදී "Youth Cadet" වරුන්හට හිමිවන සහතිකපත්.

- i ජීවන කුසලතා සහතික පත්‍රය
- ii තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් සහතික පත්‍රය
- iii ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් සහතික පත්‍රය
- iv බැහැරගත පුහුණු සහතික පත්‍රය
- v විශේෂ දක්ෂතා ඇගයීම් සහතිකපත්

(i – iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින්

3 වෘත්තීය පුහුණුව සඳහා රු 100,000 ට යටත් ශිෂ්‍යත්වයක් ලබා ගැනීමට අවස්ථාව. ( කොන්දේසි අදාල වේ.) (බැඳුම්කරයක් අත්සන් කිරීම සිදු කරනු ලැබේ.)

4 වෘත්තිමය රැකියා සඳහා මගපෙන්වීම.

5 ජාත්‍යන්තරව පිළිගත් සහතික පත්‍රයක් ලබා ගැනීමට අවස්ථාව.

6 පුහුණු කාලය තුළ පූර්ණ රක්ෂණාවරණයක් හිමිවීම.

## අපගේ බැඳීම

| ලබාදෙන සේවය | යොවුන් සේනාංක පනත, ස්ථාවර නියෝග හා වරින්වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා රෙගුලාසි | සේවය ලබාදීමේ ප්‍රමිති (පැය/සති/දින) | ඉදිරිපත් කලයුතු ලේඛන, ආකෘති පත්‍ර හා අනෙකුත් විස්තර | ඔබට උදව් ලබාගත හැකි නිලධාරීන් |
|---|---|---|---|---|
| | | | | |
| මුල් පත්වීමක් ලැබූ නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිගොනුව ආරම්භ කොට පවත්වා ගෙන යාම. | නව පත්වීමක් ලබාගෙන එන නිලධාරියකු පත්වීම් ලිපියේ සඳහන් පරිදි එකී කොන්දේසි වලට යටත් වෙමින් සම්පූර්ණ කළ යුතු ලේඛන සම්පූර්ණ කර සති දෙකක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රජයේ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම.<br><br>ලිපිගොණුව යාවත්කාලීන කළ හැකි කාලය සති 01 | • පත්වීම් ලිපිය<br>• පත්වීම් භාර ගැනීමේ ලිපිය<br>• වැඩ භාර ගත් බව දන්වන ලිපිය<br>• ජීව දත්ත තොරතුරු පත්‍රිකාව (CV)<br>• උප්පැන්න සහිකය (මුල් පිටපත)<br>• අධ්‍යාපන සහතික<br>• 157 ව්‍යවස්ථාව<br>• දිවුරුම ප්‍රතිඥාව (පොදු 278)<br>• ගිවිසුම (පොදු160)<br>• වෛද්‍ය වාර්තාව (පොදු 169)<br>• වත්කම් බැරකම්<br>• විවාහ සහතිකය<br>• ජාතික හැඳුනුම්පතේ ජායා පිටපත<br>• වැටුප් සැකසීම සඳහා අවශ්‍ය ලේඛන<br>• සේවක අර්ථ සාධක අරමුදලට ලියාපදිංචි වීම සඳහා ABH පත<br>• වත්කම් බැරකම් ප්‍රකාශය (පොදු 261)<br>• විවාහක අවිවාහක බව (පොදු 176) | අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය)<br>071- 4957300<br>සහකාර අධ්‍යක්ෂ (පාලන)<br>011 2676019<br>පරිපාලන නිලධාරී (මානව සම්පත්)<br>011 2670281 |
| පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කිරීම. | ස්ථිර කිරීමට පෙර සමත් විය යුතු කොන්දේසි සමත් වීම.<br><br>1) පත්වීම සමඟ ඉදිරිපත් කළ යුතු මූලික ලිපි ලේඛන සියල්ල සම්පූර්ණ කර තිබීම.<br><br>2) පත්වීමට අදාළ මූලික සුදුසුකම් නිවැරදි බවට තහවුරුව තිබීම.<br><br>3) වැටුප් වර්ධක දෙකක් උපයා ගෙන තිබීම.<br><br>4) චෝදනා හෝ දඬුවම් නොමැතිවීම.<br><br>5) රාජකාරි පැහැර හැරීම්,අනලස් භාවය සම්බන්ධයෙන් පැමිනිලි නොමැතිවීම. | මෙම ලියකියවිලි හා නිර්දේශිත ලිපි අවශ්‍ය නිලධාරීන්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගතවන කාලය සති 02 | ස්ථිර කර දෙන ලෙස ඉල්ලන ලිපිය ස්ථිර කිරීමට පෙර සමත් විය යුතු කඩයිම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර | |

| | | | | |
|---|---|---|---|---|
| වැටුප් වර්ධක ලබා දීම. | කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීම. | අනුමැතිය ලබා ගැනීම සඳහා ගතවන කාලය සති 02 | අදාළ ආකෘති පත්‍රය පොදු 232 සම්පූර්ණ කර නිර්දේශ හා අනුමැතිය සහිතව ඉදිරිපත් කළ යුතුය | |
| කාර්ය මණ්ඩල ශිෂ්‍යත්ව ලබා දීම. | ලිත් මසකට පෙර ශිෂ්‍යත්ව ලබා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කිරීම. | අනුමැතිය ලබා ගැනීම සඳහා ගතවන කාලය සති 02 | ශිෂ්‍යත්ව ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය (ප්‍රධානීන්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කිරීම.<br><br>ඉල්ලුම්කරු පාඨමාලාවට ලියාපදිංචි වීමට අදාළ ලේඛන පාඨමාලා ගාස්තු ගෙවීමට අදාළ බිල්පත්<br><br>ගිවිසුම් පත්‍රය | |
| EPF/ETF ප්‍රතිලාභ අයදුම් කිරීම. | EPF/ETF ලබා ගැනීමට අවශ්‍ය කොන්දේසි සපුරා තිබිය යුතුය. | නිසි පරිදි ඉල්ලා අස්වීම සිදු කළහොත් විදිනම අවශ්‍ය පෝරම සම්පූර්ණ කරනු ලැබේ. | EPF/ETF අයදුම් පත්‍රය, ජා.හැ පිටපත්, බැංකු ගිණුමේ පිටපත්, ETF අවසාන ගිණුම් ප්‍රකාශනය | |
| සේවයෙන් ඉල්ලා අස්වීම | අස්වීම් ලිත් මසකට පෙර ලිඛිතව දැනුම් දීම නිසි පරිදි නිශ්කාෂණ කටයුතු සිදු කිරීම. | අස්වීම පිළිගත් බව සතියක් ඇතුලත දැනුම් දීම.<br><br>ඉල්ලා අස්වීම ලිඛිතව අධ්‍යක්ෂ වෙත යොමු කිරීම. | නිශ්කාෂණ ලිඛිතව ඉදිරිපත් කොට නිර්දේශ ලබා ගැනීම | |
| පාරිතෝෂික ගෙවීම් | වසර 05 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | නිශ්කාෂණ කටයුතු සිදු කිරීමෙන් පසු මසක් ඇතුළත. | විධිමත් ඉල්ලා අස්වීමේ ලිපිය ඉල්ලා අස්වීම පිළිගත් බවට නිකුත් කරන ලිපිය<br><br>සම්පූර්ණ කරන ලද නිශ්කාෂණ වාර්තාව | |

| | | | | |
|---|---|---|---|---|
| පුහුණුලාභීන් බඳවා ගැනීම පිළිබඳව ආයතනික කටයුතු | | | | |
| පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන පුහුණු ලාභීන්ගේ පුද්ගලික ලිපිගොනුව | පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන පුහුණුලාභීන්ගේ බඳවා ගැනීම් අයදුම් පත්‍රයේ සටහන්, ලියකියවිලි සම්පූර්ණ කොට ඉදිරිපත් කළ යුතුය. | ලිපිගොනුව යාවත්කාලීන කල හැකි කාලය - සති 01 | • බඳවා ගැනීම් පෝරමය<br>• අධ්‍යාපන සහතිකවල සත්‍ය පිටපත්<br>• උප්පැන්න සහතිකයේ පිටපතක්<br>• ඡායා රූප දෙකක්<br>• පාසැල හැරයාමේ සහතිකය<br>• ග්‍රාම නිලධාරී සහතිකය<br>• ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත | අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) 071-4811859<br>සහකාර අධ්‍යක්ෂ (පුහුණු) 011-2670378<br>සහකාර අධ්‍යක්ෂ (සබරගමුව පළාත) 033-2215863<br>සහකාර අධ්‍යක්ෂ (නැගෙනහිර පළාත) 026-3135885<br>සහකාර අධ්‍යක්ෂ (ඌව පළාත) 057-2052393<br>සහකාර අධ්‍යක්ෂ (උතුරු පළාත) 024-2054751<br>සහකාර අධ්‍යක්ෂ (බස්නාහිර පළාත) 033-2215863<br>සහකාර අධ්‍යක්ෂ (උතුරු මැද පළාත) 025-2264180<br>සහකාර අධ්‍යක්ෂ (දකුණු පළාත) 047-2257243<br>සහකාර අධ්‍යක්ෂ (මධ්‍යම පළාත) 081-2077158<br>සහකාර අධ්‍යක්ෂ (වයඹ පළාත) 037-2268980 |
| දේශන ශාලා හා ක්‍රීඩාපිටි පහසුකම් ලබා ගැනීම | | | | |
| දේශන ශාලා පහසුකම් | පහසුකම් සැපයීමේ හැකියාව පරීක්ෂා කර දැනුම් දීම<br>ආයතනික ගිණුම<br>ගිණුම් අංකය- 7040885<br>BOC ටොරින්ටන් ශාඛාව (453)<br>ගිණුමේ නම<br>සභාපති, ජාතික යොවුන් සේනාංකය<br><br>ඉහත ගිණුමට මුදල් බැර කර රිසිට් පතෙහි පිටපත finance@ youthcorps.lk විද්‍යුත් ලිපිනයට යොමු කරන්න. | ඉල්ලුම් කළ දිනයේ ලිඛිතව දැනුම් දීම. (අවශ්‍යතාවයට සති 02කට පෙර) | ලිඛිත ඉල්ලීමක් නියමිත ආකෘති පත්‍රයන්ට අනුව යොමු කිරීම. දුරකථන මාර්ගයෙන් දැනුම් දීම. | අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මුල්‍ය) 071-4957300<br><br>සහකාර අධ්‍යක්ෂ (සියලු පළාත්)<br><br>අදාල පුහුණු මධ්‍යස්ථානයේ මධ්‍යස්ථානාධිපති |
| අනෙකුත් පාඨමාලා පුහුණුකිරීම් (පුද්ගලික ප්‍රතිපාදන මත පහසු කරන කටයුතු වෙනුවෙන්) | | | | |

| | | | | |
|---|---|---|---|---|
| බාහිර පාර්ශ්වයන්ගේ ඉල්ලීම්වලට අනුව වෙනත් පාඨමාලා සිදු කිරීම. | තම අවශ්‍යතා අධ්‍යක්ෂ වෙත ලිඛිතව ඉදිරිපත් කිරීම. | පුහුණුව ඉල්ලීම් කරනු ලබන පාර්ශ්වයන්ගේ අවශ්‍යතාවය මත කාලය තීරණය වේ.<br>(දින 1/2, දින 03, දින 14, මාස 03) | පුහුණු අවශ්‍යතා ලිපිය ලබා ගැනීම අධ්‍යක්ෂ අනුමැතියට ඉදිරිපත් කිරීම.<br><br>පුහුණු අංශය තුළින් අදාළ පාර්ශව ලිඛිතව දැනුවත් කිරීම.<br><br>බඳවා ගැනීම ඉල්ලීම අනුව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම හා පසු විපරම් කිරීම. | අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන)<br>071-4811859<br><br>සහකාර අධ්‍යක්ෂ (පුහුණු)<br>011-2670378 |
| බඳවා ගැනීම් සඳහා ප්‍රචාරණය සිදු කිරීම | | | | |
| සමාජ මාධ්‍ය භාවිතා කරමින් බඳවා ගැනීම් සිදු කිරීම ක්ෂේත්‍රයට ගොස් දැනුවත් කිරීම. | පුහුණු අංශයේ ඉල්ලීම පරිදි මාධ්‍ය අංශය මගින් සමාජ මාධ්‍ය ඔස්සේ දැනුවත් කිරීම.<br><br>ඒ ඒ මධ්‍යස්ථාන විසින් සමාජ සමූහ දැනුවත් කිරීම | බඳවා ගන්නා ලද පාඨමාලා නිමවීමට මසකට පෙර සිට සිදු කරනු ලබයි.<br><br>පාඨමාලා ආරම්භ කිරීමට මසකට පෙර සමාජ සමූහ දැනුවත් කිරීම.පළාත් කාර්යාල හා මධ්‍යස්ථාන මට්ටමින් සිදු කරනු ලබයි.<br><br>රජයේ ගැසට් පත්‍රයේ බඳවා ගැනීම් ආරම්භ කිරීමට මසකට පෙර පළ කරනු ලබයි. | පාඨමාලා විස්තර ඇතුලත් වීඩියෝ පට<br><br>රූපවාහිනී දැනුවත් කිරීම්<br><br>රජයේ ගැසට් පත්‍රය<br><br>පෝස්ටර් / බැනර් / අත් පත්‍රිකා<br><br>පුහුණුලාභීන් තුළින් | අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන)<br>071-4811859<br>0112688885<br><br>සහකාර අධ්‍යක්ෂ (පුහුණු)<br>011-2670378<br><br>මාධ්‍ය අංශ ප්‍රධානි<br>011-2688885/283 |
| විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතා කරමින් බඳවා ගැනීම් සිදු කිරීම | පුහුණු අංශයේ ඉල්ලීම පරිදි මාධ්‍ය අංශය මගින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ දැනුවත් කිරීම. | පාඨමාලා ආරම්භ කිරීමට මසකට පෙර විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රචාරණ කටයුතු සිදු කරයි. | මුද්‍රිත මාධ්‍ය දැන්වීම්<br>ගුවන් විදුලිය සඳහා දැන්වීම්<br>රූපවාහිනී සම්මුඛ සාකච්ඡා | |

# ඔබට සේවා සපයන යොවුන් සේනාංක මධ්‍යස්ථාන

ජාතික යොවුන් සේනාංක මූලස්ථානය


ලිපිනය : ජාතික යොවුන් සේනාංක මුලස්ථානය,
නො. 420,බෞද්ධාලෝක මාවත, කොළඹ 07
දුරකථන අංකය : 011-2688885
ෆැක්ස් : 011 2 684 784
විද්‍යුත් ලිපිනය : info@youthcorps.lk


පුහුණු මධ්‍යස්ථාන

| | පළාත | දිස්ත්‍රික්කය | මධ්‍යස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| 1 | බස්නාහිර පළාත | කොළඹ | රාජගිරිය | බණ්ඩාරනායක පුර, රාජගිරිය | 071 0491784 |
| 2 | | ගම්පහ | අත්තනගල්ල | වතුපිටිවල, අත්තනගල්ල, නිට්ටඹුව. | 033 2282232 |
| 3 | | | දිවුලපිටිය | වල්පිට, දිවුලපිටිය. | 033 2272875 |
| 4 | | | කටුනායක | ධම්මාලෝක මාවත, වලාන, කටුනායක. | 011 2260020 |
| 5 | | | යක්කල | වැරැල්ලවත්ත, යක්කල, ගම්පහ. | 033 2233534 |
| 6 | | කළුතර | බුලත්සිංහල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, බුලත්සිංහල. | 034 2282322 |
| 7 | මධ්‍යම | මහනුවර | සෙංකඩගල | සිරිමල්වත්ත, ඔකස්ටාවත්ත, සෙන්කඩගල, මහනුවර | 081 2389134 |
| 8 | | | යටිනුවර | මුරුතලාව පාර, දෙහිදෙණිය, යටිනුවර. | 081 2410026 |
| 9 | | | ගම්පොළ | කුඩමාකේ,නාවලපිටිය පාර, ගම්පොළ | 081 2078177 |
| 10 | | නුවරඑළිය | නුවරඑළිය | මීපිලිමාන,අඹේවෙල,නුවරඑළිය | 052 2237416 |
| 11 | | | වලපනේ | හරස්බැද්ද , වලපනේ. | 052 2050010 |
| 12 | | මාතලේ | නාඋල බැහැරගත පුහුණු මධ්‍යස්ථානය | අරංගල, නාවුල. | 066 2246225 |
| 13 | | | නාඋල | අරන්ගල, නාවුල. | 066 2246204 |
| 14 | | | දඹුල්ල හෝටල් පුහුණු පාසල | ඉනාමලුව, දඹුල්ල | 066 2286177 |
| 15 | දකුණු පළාත | ගාල්ල | ගාල්ල | වැකුණගොඩ පාර, බෝපේ, ගාල්ල | 091 2233182 |
| 16 | | | අක්මීමන | චීන මිත්‍රත්ව ගම්මානය, කුරුඳුවත්ත, අක්මීමන | 091 3121736 |
| 17 | | | නෙලුව | පියසේන ගමගේ පරිශ්‍රය, ඇබලේගෙ දර, නෙලුව | 091 3098911 |
| 18 | | මාතර | අකුරැස්ස | මාරඹ, අකුරැස්ස | 041 3131216 |
| 19 | | | දික්වැල්ල | ඌරුගමුව, දික්වැල්ල | 041 2255055 |
| 20 | | හම්බන්තොට | සූරියවැව | වෙනිවැල් ආර , සූරියවැව | 047 3133800 |
| 21 | | | වීරවිල | තිස්සපුර, වීරවිල | 047 3128444 |
| 22 | | | ලුණුගම්වෙහෙර | ලුණුගම්වෙහෙර | 047 2239292 |
| 23 | | | වීරකැටිය | නයිගල, හකුරුවෙල, වීරකැටිය | 047 2257143 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 24 | නැගෙනහිර | ත්‍රිකුණාමලය | කුච්චවේලි | සාලාපේ ආරු, කුච්චවේලි. | 026 2228709 |
| 25 | | | සේරුවිල | සිරිදුව , සේරුවාවිල | 026 4549439 |
| 26 | නැගෙනහිර | | ගෝමරන්කඩවල | විල්පනාකුලම, ගැමුණුපුර, ගෝමරන්කඩවල | 026 4549428 |
| 27 | | | ත්‍රිකුණාමලය | වටරවුම් පාර, සර්ධාපුර, චීනවරාය. | 026 4549432 |
| 28 | | අම්පාර | දෙහිඅත්තකන්ඩිය | ලිහිණියාගම, දමනේවෙල, දෙහිඅත්තකඩිය | 027 2056723 |
| 29 | | | අම්පාර | උහන පාර, අම්පාර. | 063 2224810 |
| 30 | | වාලච්චේන | වාලච්චේන | 14කණුව, පලමුතිරවෝලායිපාර, කල්කුඩා, වාලච්චේන | 065 3121085 |
| 31 | උතුරු මැද පළාත | පොලොන්නරුව | මැදිරිගිරිය | නවනගරය පාර, යාය 03, මැදිරිගිරිය | 027 2050477 |
| 32 | | අනුරාධපුර | කැකිරාව | මහවැලි පෙදෙස, ඕළුකරඳ, කැකිරාව | 025 2263297 |
| 33 | | | කලාවැව | ගල්නෑව , බුල්නෑව , කලාවැව | 025 2269946 |
| 34 | | | ගලෙන්බිදුනුවැව | මෙගොඩවැව, යකල්ල , ගලෙන්බිදුනුවැව | 025 2258355 |
| 35 | | | අනුරාධපුර | මහපාලාඩිකුලම් , අනුරාධපුරය. | 052 3852809 |
| 36 | උතුරු පළාත | මන්නාරම | මන්නාරම | තලෙමන්නාරම් පාර, මන්නාරම. | 023 2251917 |
| 37 | | මුලතිව් | මුලතිව් | වඩ්ඩුවාක්කල්, මුලතිව්. | 021 2290428 |
| 38 | | වව්නියා | වව්නියා | ඉරට්ටේපෙරියකුලම්,වව්නියාව | 024 2054558 |
| 39 | වයඹ පළාත | කුරුණෑගල | අලව්ව | විල්ගමුව, වෙස්ඔරුව , අලව්ව | 037 2067885 |
| 40 | | | පඩුවස්නුවර | නුගවැල හංදිය, තුත්තිරිපිටිගම, පඬුවස්නුවර. | 037 2291803 |
| 41 | | | දොඩම්ගස්ලන්ද | අලකොළමඩ, මදුරාගොඩ, දොඩම්ගස්ලන්ද | 037 2252655 |
| 42 | | | මාවතගම | ඩෙන්වෝර්වත්ත, මාවතගම. | 037 2298668 |
| 43 | | | වාරියපොළ | උසාවි මාවත, වාරියපොල. | 037 2268375 |
| 44 | | | නාත්තණ්ඩිය | සාගරගම, නාත්තන්ඩිය. | 032 2050815 |
| 45 | | පුත්තලම | වෙන්නප්පුව | කමලසිරි මාවත, බෝලාන, වෛකාල | 031 2277199 |
| 46 | | | කුලියාපිටිය | දෙගම්මැද, වැවගම. කුලියාපිටිය. | 037 2283680 |
| 47 | සබරගමුව පළාත | රත්නපුර | ඇඹිලිපිටිය | ගම්උදාභූමිය,යෝධගම, ඇඹිලිපිටිය. | 047 2262399 |
| 48 | | | බලංගොඩ | බටුගම්මන, බලංගොඩ | 045 3129898 |
| 49 | | | නිවිතිගල | අම්බලන්දෙණිය , වටාපොතපාර , නිවිතිගල. | 045 2279970 |
| 50 | | කෑගල්ල | ගලිගමුව | ආසිදෙණිය , ගලිගමුව නගරය , ගලිගමුව. | 035 2282993 |
| 51 | | | දෙහිඕවිට | කනන්ගම, දෙහිඕවිට | 036 2267671 |
| 52 | | | කෑගල්ල | මොරමුරේ මාවත, ගංගොඩවත්ත , කෑගල්ල. | 035 2223260 |
| 53 | ඌව පළාත | බදුල්ල | මහියංගනය | මාපාකඩවැව , මහියංගනය. | 055 2257118 |
| 54 | | | බණ්ඩාරවෙල | බිඳුණුවැව, බණ්ඩාරවෙල. | 057 2222214 |
| 55 | | මොණරාගල | මොණරාගල | කිරිමණ්ඩල මාවත, සිරිගල, මොණරාගල | 055 2055741 |
| 56 | | | වැල්ලවාය | යාලබෝව , වැල්ලවාය | 055 2274157 |
| 57 | | | තණමල්විල | බෝදාගම, සූරියආර, තණමල්විල | 047 3220529 |
| 58 | | | සියඹලාන්ඩුව | මහකලුගොල්ල,පොතුවිල් පාර, සියඹලාන්ඩුව | 070 3538292 |

## අපගේ අපේක්ෂාව

අප ආයතනය කෙරෙහි ඔබ තබා ඇති විශ්වාසය පිළිබඳ අපගේ ස්තූතිය පළකර සිටින අතර, අපගේ සේවය සඳහා ඔබ විසින් කරනු ලබන ඉල්ලීම්, යුක්ති සහගත, සාධාරණ සහ නියමිත කලට ඉදිරිපත් කිරීමෙන් ද, අංග සම්පූර්ණ නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමෙන් ද අපගෙන් අපේක්ෂා කළ හැකි සහ අපේක්ෂා කළ නොහැකි දේ පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබා තිබීම මගින් ද ඔබට අප හට සහයෝගය පළකල හැකි බව දන්වනු කැමැත්තෙමු·

## අපගේ ප්‍රමිතීන්

✓ ඔබගෙන් ලැබෙන සෑම ලිඛිත ඉල්ලීමකටම කඩිනම් ප්‍රතිචාර අපෙන් ලැබෙනු ඇත (අවසන් පිළිතුරක් යැවිය නොහැකි අවස්ථාවකදී සතියක් ඇතුළත ලිපිය ලද බවට අතුරු පිළිතුරක් සහ සති හතරක් (04) ඇතුළත අවසන් පිළිතුරක් ඔබට ලබා දෙනු ඇත.)

✓ එසේම විද්‍යුත් තැපෑල සඳහා ලැබෙන ලිපි සඳහා එදිනම පිළිතුරු ලබා දීමට කටයුතු කරන අතර, එසේ පිළිතුරු ලබා දීමට නොහැකි අවස්ථාවකදී ලිපිය ලද බවත්, ඒ සඳහා සාධාරණ කාලයක් තුළ පිළිතුරක් ලබා දීමටත් කටයුතු කරනු ඇත.

✓ කාර්යාලය සඳහා ලැබෙන දුරකථන ඇමතුම් සඳහා ඒ අවස්ථාවේදීම පිළිතුරු ලබාදීමට නොහැකි /අපහසු කරුණු සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් විසින් සාධාරණ කාලයක් ඇතුළත පිළිතුරු ලබා දීමට ද කටයුතු කරනු ඇත.

✓ ඔබ ඉල්ලා ඇති සේවය අප විසින් දැනුම් දී ඇති කාල පරාසය තුළ ඔබට ලබා දීමට අපි බැඳී සිටින්නෙමු.

✓ අවසාන තීරණය ගැනීම ප්‍රමාද විය හැකි හෝ අනිවාර්යයෙන්ම ප්‍රමාද වන අවස්ථාවක දී හෝ ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වූ විටක එයට හේතුව අප විසින් කඩිනමින් ඔබ වෙත දන්වනු ලැබේ.

# පැමිණිලි සහ සහන ලබාදීමේ ක්‍රමවේදය

අප ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ආචාර සම්පන්නව සහ සහයෝගශීලිව අවශ්‍ය සේවාවන් ඔබට සැපයීමට බැඳී සිටී. ඉහත සඳහන් ප්‍රමිතීන් හා සම්බන්ධ ඔබට ඇති පැමිණිලි පහත සඳහන් නිලධාරීන් වෙත දැනුම් දිය හැකි බව දන්වමු

**බ්‍රිගේඩියර් ආර්.එම්.එස්.පී. රත්නායක යුඑස්පී පීඑස්සී අයිජී**

| | | |
|---|---|---|
| තනතුර | : | අධ්‍යක්ෂ |
| පිහිටි ස්ථානය | : | ජාතික යොවුන් සේනාංක මූලස්ථානය |
| දුරකථනය/ෆැක්ස්/ඊ-මේල් | : | 071-8550554/director@youthcorps.lk |

**නීතිඥ ආර් නිශාන්ත පුෂ්පකුමාර**

| | | |
|---|---|---|
| තනතුර | : | අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) |
| පිහිටි ස්ථානය | : | ජාතික යොවුන් සේනාංක මූලස්ථානය |
| දුරකථනය/ෆැක්ස්/ඊ-මේල් | : | 071-4957300/adlaf@youthcorps.lk |

**සමන් කුලසූරිය**

| | | |
|---|---|---|
| තනතුර | : | අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) |
| පිහිටි ස්ථානය | : | ජාතික යොවුන් සේනාංක මූලස්ථානය |
| දුරකථනය/ෆැක්ස්/ඊ-මේල් | : | 071-4811859 /adltd@youthcorps.lk |

සියලූ පැමිණිලි ලද බව දින 03ක් ඇතුළත දන්වන අතර අවසාන පිළිතුර දින 07ක් ඇතුළත දන්වනු ලැබේ.

# සෘජු තොරතුරු ලබා දීමේ නිලධාරීන්

නම්කළ නිලධාරී : **බ්‍රිගේඩියර් ආර්.එම්.එස්.පී. රත්නායක යූඑස්පී පීඑස්සී අයිජී**
අධ්‍යක්ෂ
අංක 420, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
011-2697622 / 071-8550554
director@youthcorps.lk

තොරතුරු නිලධාරී : **නීතිඥ ආර්. නිශාන්ත පුෂ්පකුමාර**
අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය)
අංක 420, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
071-4957300
adlaf@youthcorps.lk

**ඩී.එම්.ටී.එම්. රණසිංහ**
සහකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්)
අංක 420, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
011-3152664/071-4957340
adoperation@youthcorps.lk

සේවාලාභී මහජන ඔබෙන් ඉදිරිපත් වන යෝජනා අපි සතුටින් භාර ගනිමු.

අ) අපගේ සේවාවන් ලබන ඔබ හෝ ඔබේ නියෝජිතයින් සමග අප නිරන්තරයෙන් සාකච්ඡා කිරීමට කැමැත්තෙමු. ඔබ අප සමග සම්බන්ධ වීමට අපේක්ෂා කරන්නේ නම් කරුණාකර 011-2688885 දුරකථන අංකයෙන් අමතන්න.

ආ) මෙම ප්‍රඥප්තියට ඇතුළත් කර ඇති කරුණු පිළිබඳ ඔබේ අදහස් හා යෝජනා ලබා දීමට ඔබ දක්වන කැමැත්ත ඇතුළත් කර ඔබගේ විස්තර අපගේ info@youthcorps.lk විද්‍යුත් ලිපිනය වෙත යොමු කරන්න.

ඇ) ඔබගේ අදහස් හා යෝජනා පහත ලිපිනය වෙත ලිඛිතව ඉදිරිපත් කරන්න.

ජාතික යොවුන් සේනාංක මූලස්ථානය,
නො 420,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

අප ආයතනය පිළිබඳ තොරතුරු www.youthcorps.lk වෙබ් අඩවියට පිවිසීමෙන් වැඩිදුරටත් දැනගැනීමේ හැකියාව පවතී. පුරවැසි ප්‍රඥප්තිය, අප විසින් සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ඔබත්, අපත් එක්ව දරන ඒකාබද්ධ ප්‍රයත්නයකි. අප ලබාදෙන සේවය තවත් වැඩිදියුණු කිරීමට ඔබ විසින් දක්වන ප්‍රතිචාරය අපට උපකාරී වන බව ඔබ වෙත දැන්වීමට කැමැත්තෙමු.

**ප්‍රඥප්තිය යටතේ ලබාදෙන සේවාවන් නිරතුරුව සංශෝධනය කිරීමට සහ වැඩිදියුණු කිරීමට අපි බැඳී සිටිමු.**